**ශීර්ෂය - 258 මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය - 258 මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 මැයි 10 දින නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශනය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපී වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශය ක්‍රියාත්මක කර තිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**ගිණුම්කරණ අඩුපාඩු**

**දේපල පිරියත හා උපකරණ**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ වත්කම් විෂයයන් 05 ක ඉකුත් වර්ෂයේ අවසාන ශේෂයට වඩා රු.9,818,250 ක් වැඩියෙන් සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂය ලෙස දක්වා තිබුණි. | භාණ්ඩාගාර **SA 82** අනුව වත්කම් අයිතම 05 ක අගයන් සමාලෝචිත වර්ෂයේ වැඩියෙන් පෙන්වා ඇති බව පිළිගන්නා බව. | ගිණුම් ශේෂවල වෙනස්කම් හඳුනා ගෙන නිවැරදි කළ යුතුය. |
| (ආ) | ශේෂ පිරික්සුම අනුව ජංගම නොවන වත්කම් විෂයයන් 05 ක සමාලෝචිත වර්ෂයේ එකතු කිරීම් ACA-6 (SA 82) වාර්තාවේ දක්වා ඇති ශේෂයන් සමඟ සැසඳීමේදී රු.7,401,750 ක වෙනසක් ද, ජංගම නොවන වත්කම් විෂයයන් 02 ක සමාලෝචිත වර්ෂයේ බැහැර කිරීම් ACA-6 (SA82) වාර්තාවේ දක්වා ඇති ශේෂයන් සමඟ සැසඳීමේදී රු.4,325,500 ක වෙනසක්ද පැවතුණි. | ආරම්භක ශේෂයන් සම්බන්ධයෙන් 2022 වර්ෂයේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් සිදු කළ එකතු කිරීම් මෙම වෙනසට හේතු වී ඇති බව. | ගිණුම් ශේෂවල වෙනස්කම් හඳුනා ගෙන නිවැරදි කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්**

| නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් පවතින බවත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව පද්ධතියේ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වෙනස්කම් සිදු කිරීමටත් වරින් වර සමාලෝචනය සිදු කරන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී මූල්‍ය ප්‍රකාශනවල අත්සන් කර ඇති බව. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නිරීක්ෂණය | | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **වටිනාකම රු.** | **අනුකූල නොවීම** | | |
| (අ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | | | | |
| | xix වන පරිච්ඡේදයේ 6.1 හා 7.2 උපවගන්ති | | නියැදි පරීක්ෂාවට අනුව පොරොත්තු ලේඛනයේ නිලධාරීන් සිටියදී රජයේ නිවාස ලබාදුන්, බදු කාලය වසර 5 ක් ඉක්ම ගොස් ඇති නිලධාරීන් 05 කට විටින් විට කාලය දීර්ඝ කර පදිංචිව සිටීමට ඉඩකඩ ලබා දී තිබුණු අතර, බදු කාලය ඉක්මවා පදිංචිව සිටි කාලය වෙනුවෙන් අයකළ යුතු දණ්ඩන කුළිය හා ප්‍රධාන තක්සේරුකරුවෙකු විසින් තක්සේරු කරන ලද පවත්නා වෙළඳපල කුළිය අයකර නොතිබුණි. | සුවිශේෂී අවශ්‍යතාවයන් සැලකිල්ලට ගෙන පදිංචි කාළය දීර්ඝ කළ අතර, එම කාල සීමාව සඳහා සාමාන්‍ය පරිදි නිවාස කුළී අයකර ඇති අතර දණ්ඩන කුලිය අය කිරීමට කටයුතු කරන බව. | ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | **වෙනත් චක්‍රලේඛ** | | | | |
| | 2017 පෙබරවාරි 15 දිනැති අංක 2017/03 දරන දිවිනැඟුම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍රලේඛයේ 04 ඡේදය, 2018 මාර්තු 07 දිනැති අංක 2018/03 (ආර්ථික සවිබල ගැන්වීම) දරන සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍රලේඛයේ 10 ඡේදය | | සමෘද්ධි ප්‍රජාව සවිබල ගැන්වීමට ක්‍රියාත්මක කළ යුතු නිශ්චිතව නම්කළ ව්‍යාපෘතිවලට ඇතුළත් නොවන ඇඟළුම් කර්මාන්තය සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06 ක ප්‍රතිලාභීන් 821 ක් හෙවත් සමස්ත ප්‍රතිලාභීන්ගෙන් සියයට 33 කට ජුකී මැෂින් ලබාදී තිබුණි. ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 ක භෞතික පරීක්ෂාව අනුව යන්ත්‍ර 29 ක් භාවිතයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි. | ප්‍රතිලාභීන්ගේ ඉල්ලීම මත ප්‍රාදේශීය ලේකම්වරයාගේ උපදෙස් හා අනුමැතිය යටතේ සිදු කර ඇති බව. | චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. ව්‍යාපෘතියක් සඳහා යන්ත්‍ර ලබාදුන් පසු නිසි ලෙස ක්‍රියාත්මක වේදැයි පසු විපරම් කිරීම සිදු කල යුතුය. |

## 2.3 වංචනික ස්වරූපයේ ගනුදෙනු

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගම සමඟ පිළිසඳරක් වැඩසටහන යටතේ ගහවට කෝරළේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක පරිසර අලංකරණ වැඩසටහනේ මල් පෝච්චි සහ පැළ මිලදී ගැනීමේදි ඇණවුම් කළ පිරිවිතරයන්ට අනුකූල නොවන ලෙස මිලදී ගැනීම හේතුවෙන් එකතුව රු.190,025 ක පාඩුවක් සිදුවී තිබුණි. | මල් පෝච්චිවල වර්ග අඩි ප්‍රමාණය අනුව අලාභය රු.28,468 ක් බවත් එම මුදල සැපයුම්කරුගෙන් අයකර ගැනීමට කටයුතු කරන බවත් හා පැළවල උස ප්‍රමාණය වැරදීමකින් පිරිවිතර හා මිල ගණන්වල ඇතුළත් වූ බවත් මියගිය පැළ සඳහා නැවත පැළ රෝපණය කරන බවත්. | ඉටු කළ වැඩ සඳහා පමණක් ගෙවීම් කිරීම හා පිරිවිතරයන්ට අනුව මිල දී ගැනීම් සිදු කළ යුතුය. |
| (ආ) | කුණ්ඩසාලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කලාසිරිගම පැරණි හස්ත කර්මාන්ත ගොඩනැගිල්ල අසල නව ප්‍රජාශාලාව ඉදිකිරීමේ කර්මාන්තයේ කම්බිදැල් ආවරණ යෙදීමේදී ඉටු නොකළ වැඩ වෙනුවෙන් රු.227,548 ක් වැඩිපුර ගෙවා තිබුණි. | තාක්ෂණික නිලධාරී පරිගණකයෙන් බිල්පත් සකස් කිරීමේදී ඉලක්කම් සඳහන් කිරීමේ ප්‍රමාද දෝෂයක් සිදු වී ඇති බව තාක්ෂණ නිලධාරී පිළිගත් බව. | ඉදිකරන ලද වැඩ සඳහා ගෙවීම් නිර්දේශ කළ යුතුය. වැඩිපුර ගෙවූ රු.227,548 කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 2.4 අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම

| නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 4.5 හා 4.6 උප වගන්ති හා 2014 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන අයවැය චක්‍රලේඛයේ 1.1.6 ඡේදය අනුව කටයුතු කර වැඩ තහනම් කර ඇති, සේවය අතහැර ගිය හා ස්ථාන මාරු වී ගිය නිලධාරීන් 06 දෙනෙකු වෙත ලබා දී තිබුණු එකතුව රු.576,359 ක ණය ශේෂ අයකරගෙන නොතිබුණි. | වැඩ තහනම් කළ හා සේවය හැර ගිය නිලධාරීන් සම්බන්ධව භාණ්ඩාගාරයට දන්වා ඇති අතර නීතිපතිගෙන් කරුණු විමසීමටද,යොමු කර ඇත. එක් ණය ශේෂයක් ඇපකරුවන්ගෙන් අයවෙන අතර ස්ථාන මාරු වී ගිය නිලධාරීන් සම්බන්ධයෙන් පළාත් සභාවෙන් ඉල්ලීම් කර ඇති බව. | ආයතන සංග්‍රහයේ විධිවිධාන හා චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කර හිඟ ණය ශේෂ අය කර ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පාතහේවාහැට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ ක්‍රියාත්මක පැෂන් වගා ව්‍යාපෘතිය සඳහා රු.3,200,000 ක් වැයකර තිබුණි. මෙම ව්‍යාපෘතියේ ප්‍රතිලාභීන් 29 දෙනෙකු වෙත ලබාදුන් පැෂන් පැළවලින් සියයට 66 සිට සියයට 93 ක් අතර පරාසයක පැළ ප්‍රමාණයක් විනාශ වී තිබුණු අතර ඉතිරි වී තිබුණු පැෂන් පැළද සාරවත්ව වර්ධනය වී නොතිබුණි. | වගාවට අවශ්‍ය රසායනික පොහොර හිඟතාවය හේතුවෙන් වගාවන් විනාශ වූ බව ප්‍රතිලාභීන්ගේ ඉල්ලීම හා කැමැත්ත මත දිගු කාලීනව වගා කළ කහ පැහැති වැල් දොඩම් ප්‍රභේදය හානි වූ වගා ක්ෂේත්‍රයන් හී ස්ථාපිත කරන බව. | අපේක්ෂිත අරමුණු ඉටු වන ආකාරයෙන් ව්‍යාපෘති ඵලදායීව ක්‍රියාත්මක කළ යුතුය. |
| (ආ) | සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ මිණිපේ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ අඩු ආදායම්ලාභී පවුල් 43 ක් තෝරාගෙන රු.1,732,500 ක් වැයකර පිටි ඇඹරුම් කර්මාන්තයක් ආරම්භ කර තිබුණි. එම ව්‍යාපෘතිය යටතේ නිෂ්පාදනය කරනු ලබන නිෂ්පාදිතයන් අලෙවි කිරීමට හෝ ඒ ආශ්‍රිත නිෂ්පාදන ක්‍රියාවලියක් ඇති කිරීමට සැලසුම් කර නොතිබීම හේතුවෙන් ප්‍රතිලාභීන්ට මෙම නිෂ්පාදන අලෙවි කිරීමට නොහැකි වී තිබුණි. | මේ වන විට විජලන යන්ත්‍රයක් මිලදී ගෙන නිෂ්පාදනය ආරම්භ කර ඇති බවත්, ජංගම වෙළඳාම සඳහා සාමාජිකයින් තිදෙනෙකු හඳුනාගෙන ඇති බවත් ඉදිරියේදී නිෂ්පාදන අලෙවියෙහි ප්‍රගතියක් අපේක්ෂා කරන බව. | අපේක්ෂිත ප්‍රතිලාභ ලබාගත හැකි වන පරිදි ව්‍යාපෘති සැලසුම් කළ යුතුය. |
| (ඇ) | සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහනේ අංක 2021/01 දරන මාර්ගෝපදේශ සංග්‍රහයට පරිභාහිරව කටයුතු කර ගළඉහළ කෝරළේ, දෙල්තොට හා පාතදුම්බර යන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල එකතුව රු.12,188,940 ක් වැයකර ක්‍රියාත්මක වැනිලා ගම්මාන ව්‍යාපෘතිය හා දියර කිරි නිෂ්පාදන ගම්මාන ව්‍යාපෘතියේ පරීක්ෂාවට ලක්කල ප්‍රතිලාභීන්ගෙන් 23 දෙනෙකු රාජ්‍ය සේවය හා සම්බන්ධිත පවුල්වල පුද්ගලයින් හා ඉහළ ආදායම් මට්ටම්වල පුද්ගලයින් බව නිරීක්ෂණය විය. | රජයේ සේවකයින් 10 දෙනෙකු හා විශ්‍රාමික හමුදා සෙබලුන් 02 වෙත ලබාදුන් කිරි ගවයින් මේ වන විට අඩු ආදායම්ලාභීන් වෙත භාරදී ඇති බවද දෙල්තොට ප්‍රාදේශීය ලේකම් විසින් ප්‍රතිලාභියා රු.200,000 ක දායකත්වයක් දැරිය යුතු බැවින් අඩු හා මධ්‍ය ආදායම්ලාභීන් තෝරාගත් බව. | මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කර ප්‍රතිලාභීන් තෝරාගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ගහ ඉහළ කෝරළේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය මඟින් ක්‍රියාත්මක වැනිලා ගම්මාන ව්‍යාපෘතිය යටතේ වැනිලා කරල් විජලනය කර විකිණීමේ අරමුණින් රු.852,200 ක පිරිවැයක් දරා වැනිලා විජලන යන්ත්‍රයක් හා එය ස්ථාපිත කිරීම සඳහා රු.1,144,218 ක පිරිවැයක් දරා ගොඩනැගිල්ලක් ඉදිකර තිබුණි. එසේ වුවද, 2022 දෙසැම්බර් මාසයේදී පරීක්ෂාවට ලක්කළ වැනිලා වගාකරුවන් අස්වැන්න නෙලා අමුකරල් බාහිර වෙළෙඳුන්ට අලෙවිකර තිබුණි. | අස්වැන්න නෙලීම ආරම්භ වන කාලය තුළ දැඩි වර්ෂාවක් පැවතීම හා යන්ත්‍රය ක්‍රියාත්මක කිරීමට භූමිතෙල් සපයා ගැනීමේ අපහසුතාවය මත වගාකරුවන් අමුකරල් බාහිරට විකිණීමට පෙළඹුණු බව. | අදාළ ව්‍යාපෘති ඵලදායීව ක්‍රියාත්මක කිරීමට සැලසුම් කළ යුතුය. |
| (ඉ) | ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘතිය යටතේ මිණිපේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ කහ වගා ව්‍යාපෘතියක් සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශයන්ගෙන් තොරව රු.475,800 ක් වැය කර කහ කිලෝ 610 ක් මිලදී ගෙන ප්‍රතිලාභීන් 10 දෙනෙකුට ලබා දී තිබුණි. මෙම කහ බීජ ප්‍රරෝහණය වී නොතිබීම හේතුවෙන් වැයකළ මුදල් නිෂ්කාර්ය වී තිබුණි. | එම කාලයේ පැවති දැඩි වර්ෂාපතනයට ගොදුරු වීම හේතුවෙන් පස සෝදායෑමට ලක්වීම, අධික ලෙස ජලය රැඳී පැවතීම වැනි හේතූන් මත ඇතැම් බීජ ප්‍රරෝහණය නොවූ බව. | අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනීමට හැකි වන ආකාරයෙන් අරමුදල් උපයෝජනය කළ යුතුය. |
| (ඊ) | පස්බාගේ කෝරළේ හා මිනිපේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල 2015 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා ක්‍රියාත්මක ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘතියේ පරීක්ෂාවට ලක්කල වසම් 6 ක ප්‍රතිලාභීන් 33 දෙනෙකුගෙන් 26 ක ප්‍රමාණයකගේ කර්මාන්ත අසාර්ථක මට්ටමක පැවතුණි. එය ප්‍රතිශතයක් ලෙස සියයට 79 මට්ටමක පැවතුණි. | පසුගිය කාලවකවානුව තුළ ඇති වූ කොවිඩ් වසංගත තත්ත්වය හා ආර්ථික පරිහානිය හේතුවෙන් ව්‍යාපෘති අසාර්ථක වී ඇති බව | මනා අධීක්ෂණයක් හා පසුවිපරම් ක්‍රියාවලියක් පවත්වාගත යුතුය. |

## 3.2 වත්කම් කළමනාකරණය

වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ කටයුතු

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 757 අනුව මහනුවර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශිය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරී කාර්යාල හා ආර්ථික සංවර්ධන නිලධාරී කාර්යාලවල භාණ්ඩ සමීක්ෂණ කටයුතු 2019 වර්ෂයෙන් පසුව සිදුකර නොතිබුණි. | 2023 වර්ෂයේ විධිමත් පරිදි භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදුකරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 3.3 කළමනාකරණ දුර්වලතා

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශිය ලේකම් කාර්යාල 09 ක නායයෑම් හා අධි අවදානම් ලෙස නම් කළ ප්‍රදේශවල පවුල් 1,070 ක් ජීවත්වන බව හඳුනාගෙන තිබුණ ද ඔවුන් වෙනත් ස්ථානයක පදිංචි කරවීම හෝ විකල්ප අවස්ථාවක් කරා යොමු නොකර අධි අවදානම් ප්‍රදේශයේම ජීවත්වීමට ඉඩහැර තිබුණි. | පදිංචිකරුවන් ප්‍රදේශය අත්හැර යාමට අකමැති වීම නැවත පදිංචිකිරීම සඳහා තෝරාගන්නා ඉඩම් නිදහස් කර ගැනීමේදී ගැටළු පැවතීම වැනි හේතුන් මේ සඳහා බලපා ඇති බව. | අධි අවදානම් ප්‍රදේශවල ජීවත්වන ජනතාවගේ ජීවිත ආරක්ෂාව සම්බන්ධයෙන් කඩිනමින් ක්‍රියා කළ යුතුය. |
| (ආ) | ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ 2020 වර්ෂයේ අධි අවදානම් ප්‍රදේශවල පදිංචි පුද්ගලයින් නැවත පදිංචි කිරීමේ වැඩසටහන යටතේ කුරුදුවත්ත ඉඩම පර්චස් 10 බැගින් වූ කැබලි 234 ට බෙදා තිබුණි. ඉන් ඉඩම් කැබලි 73 ක් පදිංචියට නුසුදුසු බවට ජාතික ගොඩනැඟිලි පර්යේෂණ හා සංවිධාන ආයතනය වාර්තා කර තිබුණ ද ඉන් පදිංචියට නුසුදුසු ඉඩම් කැබලි 43 ක් පුද්ගලයන්ට බෙදා දී රු.200,000 ක් බැගින් වූ පළමු වාරිකය ලෙස රු.8,600,000 ක් ගෙවා තිබුණි. | ඉඩම් කොටස් ලබා දෙන අවස්ථාව වන විට ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතන විසින් ලබාදෙන ලද වාර්තා ලැබී නොතිබුණු බව. | ජාතික ගොඩනැඟිලි පර්යේෂණ හා සංවර්ධන ආයතන නිර්දේශයන්ට අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2011 ජුනි 30 දිනැති විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක 5/2011 දරන හා 2009 ජූනි 08 දිනැති අංක 11/2009 දරන විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගේ විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අනුව කටයුතු නොකිරීම හේතුවෙන් ප්‍රාදේශිය ලේකම් කාර්යාල 10 ක විදෙස්ගත විශ්‍රාමිකයන් 49 දෙනෙකුට ජීවන වියදම් දීමනාව හා විශේෂ දීමනාව ලෙස රු.622,730 ක් වැඩිපුර ගෙවා තිබුණි. | අයකර ගැනීමට කටයුතු කරන බව. | වැඩිපුර ගෙවීම් අයකර ගත යුතුය. |
| (ඈ) | 1968 අංක 32 දරන පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ පනත හා 2016 අංක 08 දරන පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනතේ 512 වගන්තියට අනුව වයස අවුරුදු 15 ට එළඹෙන ශ්‍රී ලාංකික පුරවැසියන් විසින් ජාතික හැඳුනුම්පත ලබාගත යුතු වුවද, ප්‍රාදේශිය ලේකම් කාර්යාල 20 ක අවුරුදු 15 ඉක්මවූ පුද්ගලයින් 3,334ක් හැඳුනුම්පත් ලබාගෙන නොතිබුණි. | ග්‍රාම නිලධාරීන් දැනුවත් කිරීම හා ජංගම සේවා පැවැත්වීම මඟින් හැඳුනුම්පත් නිකුත් කිරීමට කටයුතු කරන බව. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ජීවනෝපාය චක්‍රීය ණය අරමුදල් ගිණුමේ ශේෂ එකතුව රු.176,654,710 ක් වූ අතර, ඉන් රු.115,504,354 ක ණය ශේෂයක් පිටහිටිව තිබුණි. මෙයින් ණයලාභීන් 128 දෙනෙකුගේ රු.4,770,272 ක ණය කල්පසු වී තිබුණු අතර, ණයලාභීන් 105 දෙනෙකුගේ රු.6,112,935 ක ණය බොල් ණය බවට පත්ව තිබුණි. | කඩිනමින් ණය පියවන ලෙස නිලධාරීන් මඟින් ණයලාභීන් දැනුවත් කර ඇති බව. | ණය කඩිනමින් අයකර චක්‍රීය අරමුදල් උපරිම ඵලදායීව උපයෝජනය කළ යුතුය. |
| (ඊ) | මහනුවර දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාර වැඩසටහන යටතේ ණයලාභීන් 1779 ක් වෙත රු.61,534,600 ක ණය ලබාදී තිබුණි. මෙම ණයලාභීන්ගෙන් 319 දෙනෙකුගෙන් රු.8,613,503 ක ණය අයවීම් අක්‍රීය වී තිබුණි. | කඩිනමින් ණය පියවන ලෙස නිලධාරීන් මඟින් ණයලාභීන් දැනුවත් කර ඇති බව. | අය නොවී පවතින ණය කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. ණය ලබාදුන් පසු පසු විපරම් කිරීමද සිදුකල යුතුය. |
| (උ) | ප්‍රාදේශිය ලේකම් කාර්යාල 08 ක විශ්‍රාමිකයින් 119 දෙනෙකු වෙත 2021 හා 2022 කාලය තුළ විශ්‍රාම වැටුප් රු.27,563,134 ක් වැඩිපුර ගෙවා තිබුණි. එම මුදලින් රු.13,417,571 ක් තවදුරටත් අයකර ගෙන නොතිබුණි. | අතපසුවීම් සිදුවී ඇති බව පිළිගන්නා අතර, මෙතෙක් අය නොකරන ලද වැඩිපුර ගෙවීම් ඉදිරියේදී අයකර ගන්නා බවත්, වැඩිපුර ගෙවීම් වලක්වා ගැනීමට කටයුතු කරන බව. | වැඩිපුර ගෙවීම් සම්බන්ධව සොයාබලා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

**4. මානව සම්පත් කළමනාකරණය**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2009 පෙබරවාරි 20 දිනැති අංක 1589/30 දරන (අතිවිශේෂ) ගැසට් පත්‍රයේ පළකළ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති (කාණ්ඩ අංක 01 හි) viii වැනි පරිච්ඡේදයේ රාජ්‍ය නිලධාරීන්ගේ ස්ථාන මාරුවීම් සම්බන්ධව විධිවිධාන හා 2001 අගෝස්තු 22 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/ 2001 මඟින් රාජ්‍ය නිලධාරීන්ගේ ස්ථාන මාරුවීමේ අවශ්‍යතාවය පෙන්වා දී තිබුණද, ප්‍රාදේශිය ලේකම් කාර්යාල 09ක නිලධාරීන් 140 ක් වසර 06 ත් 24 ත් අතර කාලයක් එකම කාර්යාලයේ සේවයේ යොදවාගෙන තිබුණි. | වසර 05 ඉක්මවා ඇති නිලධාරීන්ගේ නාම ලේඛනයක් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත යවා ඇති බව. | චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |